# යෝගාචාර විඥානවාදී බෝධිසත්ත්ව 'යෝගාභිසමය' පිළිබඳ අධ්‍යයනයක් (ආර්ය ලංකාවතාර සූත්‍රය ඇසුරින්)

**කරපික්කඩ සෝභිත හිමි**[1]

## හැඳින්වීම

මහායාන බුදුසමය බෞද්ධ චින්තන ඉතිහාසයේ වැදගත් සංවර්ධන අවධියක් ලෙස සැලකේ. බොහෝ උගතුන්ගේ අදහස අනුව ක්‍රිස්තු වර්ෂ පළමු සියවසේ කණිෂ්ක රජුගේ රාජ්‍ය සමයේ කාශ්මීරයේ ජාලන්ධර ප්‍රදේශයේ පාර්ශ්ව හා අශ්වඝෝෂ යන භික්ෂූන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ සිව්වන ධර්ම සංගායනාවෙන් අනතුරුව මහායාන බුදුසමය විධිමත් ආකාරයෙන් සංවිධානය වූ බව පිළිගනු ලැබේ. එහෙත් එහි මූලාරම්භය පිළිබඳ විමර්ශනයේදී ප්‍රතිසංස්කරණවාදී ප්‍රවණතා අනුගමනය කළ මහාසාංඝික නිකාය සහ එහි දාර්ශනික පසුබිම මහායානයේ ගොඩනැගීමට බලපෑ මූලික සාධකයක් ලෙස සැලකේ. මහායාන බුදුසමයේ වර්ධනය සඳහා බෞද්ධ නිකායාන්තරික මතවාද, බ්‍රාහ්මණික හා හින්දු ආගමික සංකල්ප, මෙන්ම සමකාලීන දාර්ශනික ප්‍රවණතා ද යම් බලපෑමක් එල්ල කළ බව බෞද්ධ මූලාශ්‍රය සහ නූතන ශාස්ත්‍රීය අධ්‍යයන මඟින් අනාවරණය වේ. මෙම සංවර්ධන ක්‍රියාවලියත් සමඟ මහායාන බුදුසමය තුළ විවිධ දාර්ශනික ගුරුකුල බිහි වූ අතර, ඒ අතරින් යෝගාචාර විඥානවාද සම්ප්‍රදාය විශේෂ ස්ථානයක් හිමි කර ගනී. විඥානයේ මූලිකත්වය, ආලයවිඥානය, ත්‍රිස්වභාවවාදය, බෝධිසත්ත්ව මාර්ගය සහ බුද්ධත්වය සාක්ෂාත් කරගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයන් ඔස්සේ මෙම සම්ප්‍රදාය මහායාන දාර්ශනික චින්තනයේ ප්‍රමුඛ ප්‍රවණතාවක් ලෙස වර්ධනය වී ඇත. යෝගාචාර විඥානවාද සම්ප්‍රදාය තුළ බෝධිසත්ත්ව සංකල්පය අතිශය වැදගත් ස්ථානයක් ගන්නා අතර, බෝධිසත්ත්වයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය, බෝධිචිත්තෝත්පාදය, පාරමිතා පූරණය සහ සර්වජන හිතසුව පිණිස බුද්ධත්වය අපේක්ෂා කිරීම යන කරුණු එම සංකල්පයේ මූලික අංග ලෙස දැක්වේ. විශේෂයෙන් ආර්ය ලංකාවතාර සූත්‍රය තුළ බෝධිසත්ත්වයාගේ අභ්‍යන්තර යෝගික පරිණාමය හා ප්‍රඥාත්මක අවබෝධය සම්බන්ධයෙන් "බෝධිසත්ත්ව යෝගාභිසමය" යන සංකල්පය විස්තර කෙරේ. ඒ අනුව, මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ යෝගාචාර විඥානවාදී මහායාන බෞද්ධ සම්ප්‍රදායේ බෝධිසත්ත්ව සංකල්පය විමර්ශනය කිරීම සහ ඒ සන්දර්භය තුළ ලංකාවතාර සූත්‍රයේ දැක්වෙන බෝධිසත්ත්ව යෝගාභිසමය පිළිබඳ මූලාශ්‍රානුගත විග්‍රහයක් ඉදිරිපත් කිරීමයි. එහිදී ආර්ය ලංකාවතාර සූත්‍රයේ දැක්වෙන බෝධිසත්ත්ව යෝගාභිසමය යනු කුමක්ද? යන ප්‍රශ්නය මෙම අධ්‍යයනයේ මූලික පර්යේෂණ ගැටලුව ලෙස සලකනු ලැබේ. මෙම අධ්‍යයනය මඟින් යෝගාචාර විඥානවාද සම්ප්‍රදාය තුළ බෝධිසත්ත්ව මාර්ගය පිළිබඳ විධිමත් හා ගැඹුරු අවබෝධයක් ගොඩනැගීමට දායක වන අතර, මහායාන බෞද්ධ දර්ශනයේ යෝගාචාර සම්ප්‍රදාය සම්බන්ධ ශාස්ත්‍රීය පර්යේෂණ ක්ෂේත්‍රයට ද වැදගත් දායකත්වයක් සපයනු ඇත.

---

1 බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.
karapikkadasobitha@gmail.com

**පර්යේෂණ අරමුණු**

**මූලික අරමුණ**

ආර්ය ලංකාවතාර සූත්‍රයේ දැක්වෙන බෝධිසත්ත්ව යෝගාභිසමය පිළිබඳ යෝගාචාර විඥානවාදී මහායාන බෞද්ධ සම්ප්‍රදායේ දෘෂ්ටිකෝණය විමර්ශනය කිරීම.

**උප අරමුණු**

- යෝගාචාර විඥානවාදයේ බෝධිසත්ත්ව සංකල්පයේ ස්වභාවය හා එහි මූලික ලක්ෂණ විග්‍රහ කිරීම.
- ආර්ය ලංකාවතාර සූත්‍රයේ අන්තර්ගත බෝධිසත්ත්ව යෝගාභිසමය පිළිබඳ මූලාශ්‍රයාගත කරුණු විශ්ලේෂණය කිරීම.
- බෝධිසත්ත්ව යෝගාභිසමය සහ යෝගාචාර විඥානවාදයේ ප්‍රධාන දාර්ශනික සංකල්ප අතර පවත්නා සම්බන්ධතාවය පැහැදිලි කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මත පදනම් වූවකි. එහි දී 'පුස්තකාල ග්‍රන්ථ පර්යේෂණ ක්‍රමවේදය' මූලිකව මෙම පර්යේෂණය සිදුකරන බැවින් ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය, අන්තර්ජාල භාවිතාව හා මානව සම්පත් භාවිතාව මඟින් අධ්‍යයනය කොට, ඒවායේ දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, විග්‍රහ කිරීම මඟින් පර්යේෂණයේ නිගමනය කරා යොමු වීම මෙහි පර්යේෂණ ක්‍රමවේදයයි.

**පර්යේෂණ ප්‍රතිඵල**

යෝගාචාර විඥානවාදී මහායාන බෞද්ධ සම්ප්‍රදාය තුළ බෝධිසත්ත්ව සංකල්පය, එහි දාර්ශනික පදනම සහ ආධ්‍යාත්මික ව්‍යුහය විධිමත් ලෙස හඳුනාගත හැකි බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය වේ.

යෝගාචාර දාර්ශනික සම්ප්‍රදායේ විඥානවාදය, ආලයවිඥානය සහ ත්‍රිස්වභාවවාදය වැනි මූලික සංකල්ප බෝධිසත්ත්ව මාර්ගය සහ බුද්ධත්වය සාක්ෂාත් කිරීමේ ක්‍රියාවලිය සමඟ සෘජු ලෙස සම්බන්ධ වන බව පැහැදිලි වේ.

ආර්ය ලංකාවතාර සූත්‍රය තුළ විස්තර වන "බෝධිසත්ත්ව යෝගාභිසමය" යනු බෝධිසත්ත්වයාගේ අභ්‍යන්තර යෝගික පරිණාමය සහ ප්‍රඥාත්මක අවබෝධය එක්ව සිදුවන විශේෂ ආධ්‍යාත්මික අවස්ථාවක් ලෙස අර්ථ දැක්විය හැකි බව පෙන්වා දිය හැක.

එම සූත්‍රානුගත විග්‍රහය මඟින් යෝගාචාර විඥානවාදී සම්ප්‍රදායේ බෝධිසත්ත්ව මාර්ගය හුදෙක් නෛතික හෝ ආචාරධාර්මික ක්‍රියාවලියක් නොව, ගැඹුරු විඥානමය පරිවර්තන ක්‍රියාවලියක් ලෙස විග්‍රහ වන බව පැහැදිලි වේ.

**සාකච්ඡාව හා සමාලෝචනය**

ආර්ය ලංකාවතාර සූත්‍රයෙහි යෝගාභිසමය නිර්දේශය තුළ මහාමති නම් බෝධිසත්ත්ව තෙමේ බුදුන් වහන්සේගෙන් බෝධිසත්ත්ව යෝගාභිසමය විමසන අයුරු දැකගත හැකි ය. *'අථ බලු මහාමතිර් බෝධිසත්ත්වෝ අනාගතං ජනතාං මසාලෝක්‍ය පුනරපි භගවන්තං අධ්‍යෙෂතේ ස්ම දේහයතු මේ භගවාන් බෝධිසත්ත්වානාං යෝග ාභිසමයං යථා බෝධිසත්ත්වා මහාසත්ත්වා මහායෝගයෝගිනෝ භවන්ති'* (විජේසිංහ, 2000: 84). මෙහි බෝධිසත්ත්ව මහාසත්ත්වවරු මහායෝගීන් බවට පත්කරවන බෝධිසත්ත්ව යෝගාභිසමය කුමක්දැයි විමසයි. 'මහායෝගීන්' යනු යෝගාචාර සම්ප්‍රදායේ උසස් බෝධිසත්ත්වරුන් ය. ඔවුහු ගැඹුරු ධ්‍යානය හා ප්‍රඥාව තුළින් චිත්තයේ සැබෑ ස්වභාවය අවබෝධ කොටගත් ආධ්‍යාත්මික වශයෙන් ඉතා සංවර්ධිත පුද්ගලයන් වේ. මෙහි දී බුදුන් වහන්සේගේ පිළිතුර වූයේ සතරාකාර ධර්මප්‍රතිපදාවකින් සමන්විත වූ බෝසත් මහසත්වරුන් මහායෝගයක යෙදෙන මහායෝගීන් බවට පත්වන බවයි. *'භගවාන් ආහ චතුර්භිර් මහාමතේ ධර්මෛඃසමන්වාගතා බෝධිසත්වා මහායෝග යෝගිනෝ භවන්ති. කතමෛශ් චතුර්භිඃ? යදූත ස්වචිත්තදෘශ්‍ය විභාවනතයා, උත්පාද ස්ථිති භංගදෘෂ්ටි විවර්ජනතයා ච, බාහ්‍යභාව අභාව උපලක්ෂණතයා ච, ස්වප්‍රත්‍යාත්ම ආර්යඥාන අධිගමතයා ච. එභිර් මහාමතේ චතුර්භිර් ධර්මෛඃ සමන්වාගතා බෝධිසත්ත්වා මහාසත්ත්වා මහයෝගයෝගිනෝ භවන්ති'* (විජේසිංහ, 2000:85).

මෙහි *ස්වචිත්තදෘශ්‍ය විභාවනාව* යනු ඉන්ද්‍රියන්ට අරමුණු වන විෂයගෝචර විද්‍යමාන ලෝකය යථාභූත වශයෙන් පවත්නක් නොව තමාගේ සිත විසින් එසේ පවතින්නකැයි දැකීමක් පමණි' යැයි භාවනා කිරීමයි. එහිදී බෝසත්ත්වරයෙක් කෙසේනම් ස්වචිත්තදෘශ්‍ය විභාවනාවෙහි යෙදේදැයි බුදුන් වහන්සේ පැහැදිලි කරති. *'තත්‍ර කථං මහාමතේ බෝධිසත්ත්වෝ මහාසත්ත්වෝ ස්වචිත්තදෘශ්‍ය විභාවනා කුශලෝ භවති? යදූත ස එවං ප්‍රත්‍යවේක්ෂතේ ස්වචිත්තමාත්‍රං ඉදං ත්‍රෛධාතුකං ආත්මආත්මීය රහිතං නිරීහං අයූහනියූහවිගතං අනාදිකාලප්‍රපංච දෞෂ්ඨුල්‍ය වාසනාභිනිවේශවාසිතං ත්‍රෛධාතුක විචිත්‍රරූප උපචාර උපනිබද්ධං දේහභෝගප්‍රතිෂ්ඨාගතිවිකල්පානුගතං විකල්ප්‍යතේ ඛ්‍යායතේ ච. එවං හි මහාමතේ බෝධිසත්වෝ මහාසත්වඃ ස්වචිත්තදෘශ්‍ය විභාවනාකුශලෝ භවති'* (විජේසිංහ,2000:85).

මෙහිදී බෝධිසත්ත්වයෙකු ආකාර හයකින් යුක්තව ප්‍රත්‍යවේක්ෂාවක යෙදෙන්නේ ය.

01. ත්‍රෛධාතුකයේ පැවැත්ම තමා විසින් තමාගේම සිත දැකීමෙන් පෙනෙන්නෙකි යැයි විමසා බලා මෙනෙහි කිරීම.

02. ත්‍රෛධාතුකය තුළ ආත්මයක් නැත. ආත්ම ස්වරූපයකින් යුතු කිසිවක් ද නැතැයි මෙනෙහි කිරීම.

03. ත්‍රෛධාතුකය තුළ හරවත්, රසවත්, ප්‍රිය වූ, මනාප වූ, ආස්වාදජනක වූ, සිත අලවන, විසිතුරු බවක් නැති බව මෙනෙහි කිරීම.

04. ත්‍රෛධාතුකය අනාදිමත් ඈත අතීත කාලයක පටන් කෙලෙස් දූවිල්ලෙන් ද කුශල වාසනාව පිවිස ගැනීමෙන් ද නිර්මාණය වී තිබෙන බව මෙනෙහි කිරීම.

05. ත්‍රෛධාතුකය රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ වැනි ප්‍රිය උපදවන විසිතුරු උපචාරයන්ගෙන් බැඳුනක් බව මෙනෙහි කිරීම.

06. ත්‍රෛධාතුකයෙහි සත්ත්වයාගේ සැරිසැරීම දේහ හෙවත් ශරීරයකින් ද, භෝග හෙවත් වස්තු සම්පත් මගින් ද, ප්‍රතිෂ්ඨා හෙවත් ගෘහ මන්දිර මගින් ද, ගති හෙවත් සැප දුක මගින් ද, විකල්ප අනුගතව පවතිනා බව මෙනෙහි කිරීම.

මේ අකාරයෙන් විමසා බලන කල්හි ත්‍රෛධාතුකය අනෙකක් නොව තමා විසින් තමාගේම සිත දැකීමෙන් පහළ වන්නකැයි බෝසත්ත්යෙකුට වටහා ගැනීමට හැකියාව ලැබෙයි. මෙය ස්වචිත්තදෘශ්‍ය විභාවනා යනුවෙන් බුදුන් වහන්සේ පෙන්වා දෙති.

ආර්යලංකාවතාර සූත්‍රයේ බෝධිසත්ත්වරුන් මහායෝගීන් බවට පමුණුවන සතර වැදෑරුම් යෝගාභිසමයෙහි දෙවැන්න නම් උත්පාදස්ථිතිභංග විවර්ජිතයයි. මෙහි දී බෝධිසත්වරු ත්‍රෛධාතුක භවත්‍රය තුළ කිසිවක් ඉපදීමෙන් පැවතීමෙන් හා නැවැත්මෙන් තොර බව වටහා ගනියි. සියල්ල ඉපදී පැවතී විනාශයට යන බවක් ත්‍රෛධාතුකය තුළ පෙන්නුම් කළ ද එවැනි කිසිවක පැවැත්මක් යථාර්ථ වශයෙන් නැතැයි වටහා ගැනීම මෙම දෙවැනි යෝගාභිසමයෙන් සිදු වේ. ඒ සඳහා සියලු භාවයෝ මායාජන්ම සදෘශයැයි ද, ස්වප්නරූප ජන්මසදෘශ යැයි ද සැළකිය යුතු බව බුදුන් වහන්සේ මහාමති බෝසතුන්ට දේශනා කරනු ලබන ආකාරය ලංකාවතාර සූත්‍රයේ දක් වේ. මෙහි මයාජන්ම සදෘශ යනු සියල්ල මායාවෙන් උපදින බවට සමානය යැයි සැළකීමය. ස්වප්නරූප ජන්මසදෘශ යනු සියල්ල සිහිනෙන් දකිනු ලැබෙන රූපවලට සමානව උපදින බව සැළකීමය.

විඥානවාදී බෝධිසත්ත්ව ධර්මයෙහි ඇතුළත් යෝගි බෝධිසත්ත්වරයෙකු විසින් භාවනාවෙහි හැසිරිය යුතු තෙවෙනි යෝගාභිසමය නම් බාහ්‍යභාව අභාව උපලක්ෂණ කුශලතාව ඇතිකර ගැනීමයි. '*තත්‍ර කථං මහාමතේ බෝධිසත්ත්වෝ බාහ්‍යභාව අභාව උපලක්ෂණ කුශලෝ භවති? යදුත මරීචි ස්වප්ත ප්‍රඛ්‍යා මහාමතේ සර්වභාවාඃ අනාදිකාල විවිධ ප්‍රපංච දෞෂ්ඨුල්‍ය විචිත්‍ර විපාක විකල්ප වාසනාභිනාවේශ හේතුකාඃ සර්වභාව ස්වභාවා ඉති සංපශ්‍යන් ප්‍රත්‍යාත්ම ආර්ය ඥානගති විෂයං අභිලෂතේ*' (විජේසිංහ,2000:90). එනම් බෝසත් මහාසත් තෙමේ බාහ්‍ය භාවයන්ගේ අභාවය උපලක්ෂණයෙහි හෙවත් විමසා දැකීමෙහි කුශලතාවය ඇතිකර ගැනීමයි. මෙහි 'බාහ්‍යභාව' යනු හේතු ප්‍රත්‍ය නිසා බිහිවන බාහිර පැවැතිම ය. ඒවා අනිත්‍ය දුක්ඛ අනාත්ම නිසා අභාවයට පත්වන්නේයැයි උපලක්ෂණය කිරීමෙහි හෙවත් විමසා බැලීමෙහි කුශලතාවය ඇතිකර ගැනීම මෙම තෙවැනි යෝගාභිසමය තුළින් සිදු වේ. ඒ තුළින් ද බාහ්‍ය භාවයන් මරීචි හෙවත් මිරිගුවක් සේ ද ස්වප්නයක් හෙවත් සිහිනයක් සේ ද ප්‍රකට කරගැනීම සිදු වේ. මෙහි දී පුද්ගලයාට බාහිර වස්තූන් ඇත යැයි හැගෙන්නේ අනාදිමත් අතීත භවයන්හි පටන් සිදුකළ විවිධ අකුශල ප්‍රපංචයන්ගේ හෙවත් ක්ලේශයන්ගේ දුෂ්ඨ කිළිටි බව නිසා යැයි දක්වා ඇත.

මෙසේ සියලු බාහිර භාවයන් හා ඒවායේ ස්වභාවයන් මිරිගුවකි සිහිනයකි යැයි දකින බෝධිසත්ත්වරයා ඉක්බිති තථාගතවරුන් අනුපිළිවෙළින් අවබෝධ කරගත් ආර්යඥාන ගමන්මඟ අවසාන වශයෙන් කැමති වෙති. එය ආර්ය ලංකාවතාර සූත්‍රයේ හතරවැනි යෝගාභිසමය ලෙස දක්වා ඇත. 'සර්වභාව ස්වභාව මරීචි ස්වප්න ඉති

සංපශ්‍යන් ප්‍රත්‍යාත්ම ආර්යඥාන ගතිවිෂයං අභිලෂතේ' (විජේසිංහ,2000:90). මේ ගමන් මග බුදුබවට පැමිණෙන සියලු බෝසත්වරුන්ගේ ආත්මභාවයෙන් ආත්මභාවයට ප්‍රතිපදාවක් වශයෙන් සපිරෙන නිසා එය ප්‍රත්‍යාත්ම ආර්යඥානගති නමින් දක්වා ඇත. මෙම යෝගාභිසමය අඛණ්ඩව යෙදීමෙන් බෝසත්වරු මහායෝගීන් බවට පත්වන්නාහුය යනුවෙන් බුදුරදුන් මහාමති බෝසතුන්ට සඳහන් කරන ආකාරය අවසානයේ දී දක්නට ලැබේ. 'එභිර් මහාමතේ චතුර්භිර් ධර්මෛඃසමන්වාගතා බෝධිසත්ත්වා මහසත්ත්වා මහායෝයෝගිනෝ භවන්ති අත්‍රතේ මහාමතේ යෝගඃ කරණීයඃ'

**ප්‍රමුඛ පද** - යෝගාචාර විඥානවාදය, මහායාන බුදුසමය, බෝධිසත්ත්ව සංකල්පය, ආර්ය ලංකාවතාර සූත්‍රය, බෝධිසත්ත්ව යෝගාභිසමය

## ආශ්‍රිත ග්‍රන්ථ


නානායක්කාර, එස්. (2003). *මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්.* දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මේධානන්ද හිමි, ඩී. (1998). *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්.* වරකාපොලඃ ආරිය ප්‍රකාශන.

විජේසිංහ, එස්.ඒ.ජී. (2000). *යෝගාචාර විඥානවාදී මහායාන දර්ශනය.* කොළඹ 10ඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, එස්.ඒ.ජී. සහ සීලක්ඛන්ධ හිමි, ඩබ්ලිව්. (2008). *බෞද්ධ සංස්කෘත මූලාශ්‍රය අධ්‍යයනය - 1.* කොළඹ 10ඃ සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම.

සුසීම හිමි, පල්ලේගෙදර, (2011). *මුල් බුදුසමය සහ යෝගාචාර විඥානවාදය,* ගම්පහඃ ලක්මාල් මුද්‍රණ.